**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතාකරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයනලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරි පනතේ, 13 (1) (ඊ) වගන්තිය | අපරාධයක වින්දිතයන් හට පනතේ 29 වගන්තිය යටතේ පිහිටුවා තිබෙන අරමුදලෙන් වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් සකස් කර එය පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කළයුතු වුවද අධිකාරිය පිහිටුවා වර්ෂ 06 ක් ගතවී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ආරක්ෂණ අරමුදලින් වන්දි ලබාදීම සඳහා මාර්ගෝපදේශ සකස් කර කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කල අතර බහුතර මතය වූයේ 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත පරිච්න්න කොට හඳුන්වාදෙනු ලබන නව පනත් කෙටුම්පතේ මෙම අරමුදලේ වන්දි ගෙවීමට අවශ්‍ය වගන්ති ඇතුලත්ව ඇති බවටය. කෙසේ වුවද තවදුරටත් මේ පිළිබඳ සාකච්ඡා කොට කඩිනමින් තීරණයක් ගැනීමට නියමිතව ඇති අතර දැනට උසාවි නියෝග මත අරමුදලින් වන්දි ගෙවීම අඛණ්ඩව සිදුකරනු ලැබේ. | වන්දි ප්‍රදානය කිරීම සඳහා යෝජනා ක්‍රමයක් කඩිනමින් සකස් කළයුතු වේ. |
| (ආ) | මු.රෙ. 104 සහ 105 | හානි පාඩු ලේඛනයට අනුව අස්ථානගත වී තිබූ ලැප්ටොප් පරිඝනකය, ලැප්ටොප් බෑගය, H/Drive තුනක් සහ Toshiba E-Studio 2508 A ඡායා පිටපත් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා | මෙම භාණ්ඩ අස්ථාන ගතවීම සඳහා මු.රෙ. 104,105 යටතේ අදාළ පරීක්ෂණ කටයුතු සිදුකරන ලද අතර, කමිටු නිර්දේශ අනුව පෞද්ගලිකව ලබා දී ඇති Hard Drive තුන සඳහා වූ පාඩුව අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු යොදා ඇත. ලැප්ටොප් පරිගණකය, බෑගය හා Toshiba ඡායා පිටපත් යන්ත්‍රයේ Dongle ය කාර්යාලයේ පොදු | මු.රෙ. 104 සහ 105 ප්‍රකාරව කඩිනමින් කටයුතු කල යුතු වේ. |

| | |
|---|---|
| වන ඩොන්ගලය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභ අය කර ගැනීම හෝ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම සිදු කර නොතිබුණි . | භාවිතයට යොදා තිබූ බැවින් කමිටු නිර්දේශයට අනුව කපා හැරීමට ගනු ලැබූ තීරණය කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කොට නැවත ජ්‍යෙෂ්ඨ නිළධාරියකු යටතේ පරීක්ෂණයක් සිදුකිරීමට උපදෙස් ලබාදුන් අතර එම කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු යොදා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.4,265,483 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,719,343 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,546,140 ක පිරිහීමක් විය. මෙම පිරිහීමට ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පුද්ගල පඩි නඩි, නඩත්තු වියදම් හා සැපයුම් හා පරිභෝජන වියදම්වල වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 මැයි 31 දිනැති අංක MOJ/E/17/T/36 දරණ අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව වාහන අළුත්වැඩියා සම්බන්ධයෙන් වන මිල ගණන් සඳහා යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශ ලබාගත යුතු බව දක්වා තිබුණද 2021 වර්ෂයේ අවස්ථා 04 කදී එකතුව රු.329,380 ක් වූ වාහන අළුත්වැඩියාවන් සඳහා යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශය ලබාගෙන නොතිබුණි. | මෙම වර්ෂයේ කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු සහභාගී කරවා ගැනීමේ අපහසුතාවය මත මෙම වාහන වලට අදාළ හදිසි අළුත්වැඩියා අදාළ ආයතන වෙතට යොමු කර ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සිදුකර ගෙන ඇත. කෙසේ වුවද, ඉදිරියේදී ප්‍රධාන අළුත්වැඩියාවන් වාර්තාවේ සඳහන් පරිදි යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු ගේ සේවය ලබා ගෙන සිදු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට විමර්ශනය කිරීමට පැමිණිලි 360 ක් ඉතිරිව තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබූ පැමිණිලි 160 ද ඇතුලත්ව පැමිණිලි 520 ක් විමර්ශනය කර ඉන් පැමිණිලි 118 ක කටයුතු අවසන් කර තිබුණි. | අධිකාරියට ලැබෙන පැමිණිලි ස්වභාවය අනුව එකිනෙකට වෙනස් වේ. පැමිණිල්ලක් කඩිනමින් අවසන් වීම කාර්යක්ෂමතාව මැනීමේ තීරණාත්මක සාධකයක් නොවේ. ඊට හේතුව සමහර පැමිණිලි සඳහා ආරක්ෂාව ලබාදීම නඩුව අවසන් වන තෙක්ම දිගින් දිගටම සිදු වේ. වීඩියෝ තාක්ෂණය මගින් සාක්ෂි | අධිකාරියේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | | ලබාගැනීමටද දිගු කාලයක් ගතවේ.සමහර පැමිණිලිවල මූලික විමර්ශන අවසන් කළ පසුවද ඒ සම්බන්ධව මූල මණ්ඩල පත්කොට තිරණ ලබාදීම සිදුවේ. | |
| (ආ) | අපරාධයක වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරි පනතේ 29 වගන්තිය අනුව පිහිටුවන ලද ආරක්ෂණ අරමුදලට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුල රැස්කල දඩ මුදල් පිලිවෙළින් රු.1,252,648 ක් හා රු.6,681,270 ක් වූ අතර පනතේ 29(4) වගන්තිය ප්‍රකාරව වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ වියදම් ලෙස පිළිවෙලින් රු.6,431 ක් පුද්ගලයින් 2 දෙනෙක් වෙත හා රු. 17,943 ක් පුද්ගලයින් 4 දෙනෙක් වෙත ගෙවා තිබුණි. ආරක්ෂණ අරමුදලේ ප්‍රධාන වියදම් ලෙස එකී පනතේ 29(4)වගන්තිය ප්‍රකාරව ගෙවන වන්දි සැලකෙන බැවින් ද, පනතේ 2 (ඇ) වගන්තිය ප්‍රකාරව අපරාධයක වින්දිතයන්ට එරෙහිව වරදක් සිදුකිරීම නිසා වරදකරු වූ තැනැත්තන්ගෙන් වින්දිතයන්හට වන්දි මුදල් ලබාගැනීමට සැලැස්වීම අධිකාරියේ අරමුණක් වන බැවින් ද ඉහත ආදායම් රැස්කිරීම හා වන්දි ගෙවීම සැලකිය යුතු ලෙස අඩුවීම නිසා ආදායම් රැස්කිරීමේ හා වන්දි ගෙවීමේ ක්‍රමය නිසි පරිදි ඉටුවේද යන්න ගැටළු සහගත විය. | ආරක්ෂණ අරමුදලට අධිකරණ මඟින් දඩ මුදලක් ආකාරයෙන් මුදල් ලැබේ. මෙම අරමුදල යටතේ වන්දි ගෙවීම දැනට සිදුකරනු ලබන්නේ උසාවි නියෝග යටතේ පමණක් වන අතර ඒ අනුව 2021 වර්ෂයේ මෙකී නියෝග වල අඩුවීමක් සිදු වී ඇති බව සත්‍යයකි. එබැවින් මෙම වන්දි මුදල් ගෙවීමේ අඩුවීමක් සිදු වී ඇත. කෙසේ නමුත් දැනට මෙම අරමුදලින් වන්දි ගෙවීමේ මාර්ගෝපදේශ සකස් කර කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කර ඇත. එහි තිරණ යටතේ නියෝග ප්‍රකාශයට පත් කිරීමට බලාපොරොත්තු වේ. | පනත ප්‍රකාරව වන්දි ගෙවීමේ යෝජනා ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුවේ. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන (UNDP) ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේ අධිකාරියට ලැබී තිබූණු වටිනාකම රු. 370,165 ක් වූ ඡායා පිටපත් යන්ත්‍රය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට ගෙන නොතිබූ අතර මේ දක්වා එහි සමුච්චිත ක්ෂය ලෙස රු.128,594 ක් අධිකාරියේ සමුච්චිත ලාභයෙන් කපා හැර තිබුණි. තවද මෙම ඡායා පිටපත් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ඩොන්ගලය අස්ථානගත වී තිබුණි | එක්සත් ජාතීන්ගේ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2018 වර්ෂයේ ලැබී තිබූ ඡායා පිටපත් යන්ත්‍රය එවකට රැකවරණ අංශයට වෙන්කර තිබුණ ද එකී අංශය නියමිත පරිදි ස්ථාපනය කර නොතිබුණු බැවින් එය ගබඩාවට යොමු කර තිබුණි. නමුත් මෙහි ඩොන්ගලය අස්ථානගත වීම නිසා යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි. දැනට මෙම යන්ත්‍රය රැකවරණ අංශය වෙත ලබා දී ඡායා පිටපත් ලබා ගැනීම සිදු කරනු ලැබේ. එසේම මෙම අස්ථානගත වීම සම්බන්ධයෙන් මු.රෙ. 104, 105 යටතේ විධිමත් පරීක්ෂණයක් සිදුකිරීමට කටයුතු යොදා ඇත. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඒ අනුව ඉල්ලීම් කර වත්කම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 17 දිනැතිව ඇමතුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම සඳහා වූ කමිටු රැස්වීමක් පවත්වා තිබූ අතර එහිදී ඇමතුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු සාකච්ඡා වී තිබුණි. ඊට අවශ්‍ය මෘදුකාංග සහ දෘඩාංග සඳහා මූල්‍ය අනුග්‍රහය UNDP ආයතනයෙන් ලබා ගැනීමට සැලසුම් කර තිබුණද කළමණාකරන මණ්ඩලයේ අවසරය ඒ සඳහා ලබා දීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම කාර්යය සිදු වී නොතිබුණි. දැනට අධිකාරිය වාර්ෂිකව රු. 540,000 ක දායක මුදලක් ගෙවමින් 1985 දරන ක්ෂනික දුරකථන සේවාව පමණක් ක්‍රියාත්මකව පවත්වාගෙන යනු ලබන අතර ඒ සඳහා හඳුන්වා දීමට නියමිතව තිබූ පද්ධතිය මේ දක්වා ක්‍රියාත්මක වී නොතිබුණු අතර දැනට ලැබෙන දුරකථන ඇමතුම් සඳහා කෙටි ලේඛනයක් පවත්වා ගනිමින් මේ දක්වා පැමිණිලි 8ක් සම්බන්ධයෙන් පමණක් කටයුතු සිදු කර තිබුණි. | 2019 නොවැම්බර් මාසයේදී Call Center පහසුකම් ස්ථාපනය සඳහා කටයුතු කළද ඒ සඳහා අනුමැතිය ලබාගැනීමට අධිකාරිය කළමනාකරණ මණ්ඩලය පත්කර නොතිබූ බැවින් එය ස්ථාපිත කිරීමට නොහැකි විය. 1985 ක්ෂණික දුරකථන සේවාව සඳහා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සංඛ්‍යාත වෙන් කිරීම වෙනුවෙන් වාර්ෂිකව රු. 540,000.00 ද දායක මුදලක් ගෙවනු ලබන අතර මෙම සේවාව යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් හදිසි පැමිණිලි 2019 වර්ෂයේ 1330 ක්ද, 2020 වර්ෂයේ 814 ක් ද වශයෙන් ලැබී තිබුනි. අධිකාරියේ විෂය පථයට අදාළ කාරණා සම්බන්ධයෙන් සටහන් කොට ඉදිරි පියවර ගනු ලැබේ. | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් ක්‍රියාත්මකකර මහජනතාවට ලබාදෙන සේවාවන් කාර්යක්ෂම කිරීමට කටයුතුකළ යුතුවේ. |
| (ආ) | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ දෙවන අදියර යටතේ 2019 වර්ෂයේදී නිමකිරීමට සැලසුම්කර තිබූ සහය හා රැකවරණ අංශ පිහිටුවීම හා පවත්වාගෙනයාම සම්බන්ධයෙන් වූ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම සහ සහය හා රැකවරණය ලබාදීමේ වැඩසටහන් සඳහා ප්‍රමිතිගත ප්‍රොටෝකෝලයක් සකස්කිරීමට අධිකාරියට සහාය දීම සමාලෝචිත වර්ෂය අවසාන වන විටද ඉටු කර නොතිබූ අතර අධිකාරියේ අරමුණු ළඟා කර ගැනීමේදී අත්‍යාවශ්‍ය වන සහය හා රැකවරණ අංශය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමද සිදුකර නොතිබුණි. | අධිකාරියේ සංවිධාන ව්‍යුහය යටතේ අධ්‍යක්ෂ (රැකවරණ), (සහායක සේවා) හා (නීති හා නීති බලාත්මක කිරීම) යන මූලික තාක්ෂණික කාර්යයන් අංශ 03 අධ්‍යක්ෂවරුන් තිදෙනකු යටතේ ස්ථාපනය කිරීමට සැලසුම් කර අදාළ කාර්යය මණ්ඩල අනුමත කරගෙන ඇත. දැනට නීති අංශය සඳහා අධ්‍යක්ෂවරයෙක් අනුයුක්ත කර ඇති අතර නව බඳවා ගැනීම් සඳහා රජය විසින් අවසරයක් ලබානොදෙන බැවින් රැකවරණ අංශය සහකාර අධ්‍යක්ෂ (නීති) යටතේ පවත්වාගෙන යනු ලබයි. | ප්‍රමුඛතාවය මත කාර්යයන් සැලැසුම් කළ යුතු වේ. |

## 3.5 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ අරමුණු ළඟා කර ගැනීමට ඉටු කළයුතු අත්‍යවශ්‍ය කාර්ය සහ කර්තව්‍යයන් වන ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අපරාධවලට ගොදුරු වූවන්ට සහ සාක්ෂිකරුවන්ට වන්දි ගෙවීම සඳහා සංවර්ධිත මාර්ගෝපදේශ වැඩිදියුණු කිරීම | අපරාධවලට ගොදුරු වූවන්ට ආරක්ෂණ අරමුදල මඟින් වන්දි ප්‍රදානය සඳහා මාර්ගෝපදේශ සකස් කර ඇති අතර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට සැලසුම් කර ඇත. Victimology, Criminology හා | ප්‍රමුඛතාවය මත කාර්යයන් සැලැසුම් කළ යුතු වේ. |

| | |
|---|---|
| සහ වෙනත් ආකාරයේ සහන ලබාදීම, වින්දිතයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අධිකරණය හමුවේ පෙනී සිටීම සඳහා නීතිඥ මණ්ඩලයක් පිහිටු වීම සහ Victimology, Criminology හා Recidivism යන විෂයයන්ට අදාල පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටු වීම සඳහා සමාලෝචිත වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මඟින් මූල්‍යනය කර ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර තිබුණත් එම ආයතනය සමඟ අදාල ගිවිසුම් අත්සන් කර වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | Recidivationයන විෂයන්ට අදාළ පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට වෙනම මූලධන වියදමක් දැරීම මෙම අවස්ථාවේදී සිදුකළ නොහැකි බැවින් මෙම විෂයන්ට අදාළ පොත්පත් මිලදී ගෙන තොරතුරු හා පර්යේෂණ ඒකකයක් ආරම්භ කරන ලදී. ඉදිරියේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සමඟ සාකච්ඡා කොට මේ සඳහා ප්‍රතිපාදන ලබාගැනීමට බලාපොරොත්තු වේ.<br>වින්දිතයන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් අධිකරණය හමුවේ පෙනී සිටීමට නීති ආධාර කොමිෂන් සභාවට අනුයුක්ත නීතිඥවරුන් දැනුවත් කර ඔවුන්ගේ සහාය ලබාගැනීමට බලාපොරොත්තු වේ. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------------- | ------------ |
| (අ) | රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කරගෙන ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබූ අතර ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන ආයතනයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කර නොතිබුණි. චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවන් සහතික කර නොතිබුණි. | 2022 සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කලයුතු වේ. |
| (ආ) | අධිකාරියේ අනුමත සේවක සංඛ්‍යාව 56 ක් වූ නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විට තථ්‍ය සංඛ්‍යාව 36 ක් විය. ආයතනයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා සෘජුවම බලපාන තනතුරු 14 ක් 2018 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩුව පවතින තනතුරු සඳහා බඳවා ගැනීමට 2020.12.06 දින පුවත්පත් දැන්වීම් පල කළද කොවිඩ් වසංගත තත්ත්වයත් සමඟ බඳවා ගැනීම් ප්‍රමාද වූ අතර 2021.08.28 දිනැතිව නිකුත් කරන ලද මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව බඳවා ගැනීම් නවතා දැමීමට සිදුවිය. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | එම පුරප්පාඩු අතර රැකවරණ නිලධාරී තනතුරු 10 ක්ද, නීති නිලධාරි හා විමර්ශන නිලධාරි තනතුරු සඳහා එක් අයෙකු බැගින්ද පුරප්පාඩු වී තිබුණි. | පුරප්පාඩු එලෙසම පැවතීමට ප්‍රධානතම හේතුව උක්ත සඳහන් හේතු කාරණාම වන අතර නීති නිලධාරී තනතුරට බඳවා ගැනීම් සිදු කර තිබූ නිලධාරිණිය | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | වෙනත් ආයතනයක තනතුරක් සඳහා 2021.12.31 වන දින සේවයෙන් අස්වීම මත නැවත එම තනතුර පුරප්පාඩු විය. | |
| (ඇ) | කළමනාකරණ සහකාර සේවයේ තනතුරු 04 ක පුරප්පාඩු පැවතීම නිසා මූල්‍ය අංශයට එක් කළමනාකරණ සහකාරවරියක් පමණක් අනුයුක්ත කර තිබුණි. මූල්‍ය අංශයේ සියලුම රාජකාරි ඇය විසින් සිදු කරගෙන යනු ලබන අතර රාජකාරි බෙදීමක් සිදුවී නොතිබීමෙන් අධිකාරියයේ මූල්‍ය කටයුතු සම්බන්ධව අභ්‍යන්තර පාලනය අයහපත් මට්ටමක පැවතුණි. | මූල්‍ය අංශය සඳහා එක් කළමනාකරණ සහකාරවරියක් එවකට අනුයුක්ත කර තිබුණද ප්‍රසූත නිවාඩු අවසන්ව සේවයට පැමිණි තවත් කළමනාකරණ සහකාරවරියක් එම අංශයට අනුයුක්ත කිරීම නිසා මෙම ගැටළුව දැනට නිරාකරණය වී ඇත. | ආයතනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු වේ. |
| (ඉ) | අධිකාරියේ අධ්‍යක්ෂ තනතුරු 06 ක් අනුමත කරගෙන තිබුණත්, සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 ක් පමණක් අනුමත කරගෙන තිබීම නිසා විධායක ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ එක් තනතුරක අධීක්ෂණයට අධ්‍යක්ෂ තනතුරු 02 කට පැවරී ඇති බව නිරීක්ෂණය විය. මේ අනුව සේවක කළමනාකරණයේ හඳුන්වාදී ඇති තනතුරු ධූරාවලිය පිරිමීඩ ආකෘතියට පටහැනි ලෙස පැවතුණි. | 2022 වර්ෂයේදී ජාතික අධිකාරියේ කාර්යමණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණ වැඩසටහන මගින් මේ සඳහා විසඳුමක් ලබා ගැනීමට බලාපොරොත්තු වේ. | තනතුරු ධූරාවලිය පිරිමීඩ ආකෘතියට අනුකූලව සකස් කළ යුතු වේ. |

**3.7 වාහන පද්ධතිය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 2(i) ප්‍රකාරව රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කර ගැනීමට කටයුතු කළයුතු වුවද අධිකාරියේ ප්‍රයෝජනය සඳහා 2018 අගෝස්තු 10 දින අධිකරණ අමාත්‍යාංශයෙන් භාරගෙන තිබුණු වාහන 08 ක ලියාපදිංචි අයිතිය අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණි. | මෝටර් රථ 05 ක අයිතිය පවරා ගැනීමට මේ වන විටත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත අදාළ ලියකියවිලි ඉදිරිපත් කර ඇති අතර ජීප් රථ දෙක අධිකරණ අමාත්‍යාංශය මගින් ජාතික අධිකාරිය වෙත ලබා දී තිබුණද එම රථවල අයිතිය තවදුරටත් මුදල් අමාත්‍යාංශය හා සැලසුම් සහ ජනවාර්ගික කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින බැවින් එම වාහන ජාතික අධිකාරිය වෙත පවරා ගැනීමේ කටයුතු සිදු කර ගෙන යනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් විය යුතු සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කල ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යමණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්යය මණ්ඩලය පිළිබඳව විස්තර, අදාල වර්ෂය සඳහා අයවැය ලේඛනය, ප්‍රධාන ප්‍රසම්පාදනයන් සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම අධිකාරිය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත්ව නොතිබුණි | 2021 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ මෙම වාර්තාවේ සඳහන් ලේඛන 2021 වාර්ෂික වාර්තාවේ කෙටුම්පතට ඇතුලත් කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතු වේ. |
| (ආ) | වින්දිතයින්/ සාක්ෂිකරුවන් සඳහා ජාතික දත්ත ගබඩාවක් පිහිටු වීමට හා සාක්ෂිකරුවන්/ වින්දිතයන් හඳුනා ගැනීමේ පෙරෙට්ටුවට ගැළපෙන පරිදි තාක්ෂණික වශයෙන් හොඳම ආකෘතියක් වැඩිදියුණු කිරීමට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි සැලසුම් කර තිබුණද ඒවායෙහි ඇස්තමේන්තුගත පිරිවැය හෝ මූල්‍ය සම්පාදන ප්‍රවාහයන් හඳුනාගෙන ඉටු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ තොරතුරු තාක්ෂණ ඒකකයක් පිහිටු වීම සඳහා අදාල තනතුරුද අනුමත කරගෙන නොතිබුණි. | ප්‍රායෝගික ගැටලු හේතුවෙන් දත්ත ගබඩා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. පනතේ 31 (1) වගන්තිය යටතේ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ සාක්ෂි හෝ ප්‍රකාශ ලබාදීම සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මඟින් සිදුකිරීමට අදාල තාක්ෂණික ඒකකය සම්බන්ධයෙන් මෙම යෝජනාව ඇතුලත් කර ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බැවින් කාර්යය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීමටද අනුමැතියක් ලැබී නොමැත. | කාර්යයන්ගේ ප්‍රමුඛතාවය සහ මූල්‍ය සම්පාදනය යන කරුණු මත පදනම්ව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. |